# අට්ඨාරසමො පාඨො

# මිච්ඡාදිට්ඨිකො අහිගුණ්ඨිකො

එකො අහිගුණ්ඨිකො ගාමනිගමරාජධානිසු සප්පෙ කීළාපෙත්වා ජීවිකං කප්පෙනේතා එකං ගාමකං පත්වා තත්ථ සප්පෙ කීළාපෙත්වා සන්තුට්ඨෙහි ගාමවාසීහි දින්න විවිධොපායනො ඛාදනීයභොජනීයං ඛාදිත්වා භුඤ්ජිත්වා තත්ථෙව නිවාසං ගහෙත්වා නිසීදි. තස්මිං කිර ගාමකෙ මනුස්සා යෙභුය්යෙන රතනත්තයමාමකා, තස්මා තෙ රත්තිභාගෙ සයන්තා 'නමො බුද්ධායා''ති එවමාදිං වදන්ති. සො පන අහිගුණ්ඨිකො මිච්ඡාදිට්ඨිකො තිණ්ණං රතනානං ගුණං න ජානාති. තස්මා තෙසං තං වචනං සුත්වා සයම්පි කෙළිං කුරුමානො පරිහාසවසෙන 'නමො බුද්ධායා''ති වදති. අථෙකදිවසං සො අත්තනො කීළාපනසමත්ථං එකං සප්පං තත්ථ තත්ථ පරියෙසමානො ආහිණ්ඩති. තදා එකො නාගරාජා කස්සපදසබලස්ස ථූපං ගන්ත්වා වන්දිත්වා එකං වම්මිකං පවිසති. තං දිස්වා අහිගුණ්ඨිකො වෙගෙනාගන්ත්වා නාගරාජං ගණ්හිතුං මන්තං පරිජපි. සො මන්තං සුත්වා කුජ්ඣිත්වා තං මාරෙතුකාමො අනුබන්ධි. තං දිස්වා අහිගුණ්ඨිකො වෙගෙන පලායන්තො එකස්මිං පාසාණෙ පක්ඛලිත්වා පතමානො පුබ්බෙ වුත්තපරිහාසවචනපරිචයෙන 'නමො බුද්ධායා''ති වදන්තො පති. තස්ස තං වචනං අනුබන්ධන්තස්ස නාගරඤ්ඤො සොතපථෙ අමතං විය පති.

**(රසවාහිනී, ජම්බුදීපුප්පත්තිකථා)**

පදමාලාව

| | | | |
|---|---|---|---|
| **අහිගුණ්ඨිකො** | (නා) | - | නයි නටවන්නා |
| **ගාමනිගමරාජධානිසු** | (ස) | - | ගම් නියම්ගම් රාජධානිවල |
| **කීළාපෙත්වා** | (පූ.ක්‍රි) | - | ක්‍රීඩා කරවා (නටවා) |
| **කප්පෙනේතා** | (ක්‍රි) | - | කරන්නේ |
| **ගාමකං** | (නා) | - | ගමකට |
| **පත්වා** | (පූ.ක්‍රි) | - | පැමිණ |
| **සන්තුට්ඨෙහි ගාමවාසීහි** | (නා) | - | සතුටු වූ ගම් වැසියන් විසින් |
| **දින්න** | (ක්‍රි) | - | දෙන ලද |
| **උපායනො** | (නා) | - | තුටුපඬුරු ඇත්තේ |
| **ඛාදනීයං** | (ක්‍රි) | - | කෑ යුතු |
| **භොජනීයං** | (ක්‍රි) | - | බුදිය යුතු |
| **භුඤ්ජිත්වා** | (පූ.ක්‍රි) | - | අනුභව කොට |
| **නිවාසං** | (නා) | - | නවාතැන් |
| **ගහෙත්වා** | (පූ.ක්‍රි) | - | ගෙන |
| **නිසීදි** | (ක්‍රි) | - | හුන්නේය |
| **යෙභුය්යෙන** | (නි) | - | බොහෝ සෙයින් |
| **රත්තිභාගෙ** | (ස) | - | රාත්‍රි භාගයෙහි |

| | | | |
|---|---|---|---|
| සයන්තා | (කි) | - | නිදන්නාහු |
| මිච්ඡාදිට්ඨිකො | (ස) | - | මිථ්‍යා දෘෂ්ටිකයෙක් |
| ජානාති | (ක්‍රි) | - | දනියි |
| තෙසං | (ස.නා) | - | ඔවුන්ගේ |
| සයම්පි | (සං) | - | තෙමේත් |
| කුරුමානො | (කි) | - | කරන්නේ |
| පරිහාසවසෙන | (නා) | - | පරිහාස වශයෙන් |
| කීළාපන | (කි) | - | ක්‍රීඩා කරවීමට |
| සමත්ථං | (නා) | - | සමත් වූ |
| පරියෙසමානො | (කි) | - | සොයමින් |
| ආහිණ්ඩති | (ක්‍රි) | - | ඇවිදියි |
| නාගරාජා | (ස) | - | නා රජෙක් |
| දසබලස්ස | (ස) | - | බුදුන් වහන්සේගේ |
| වම්මිකං | (නා) | - | තුඹසකට |
| පවිසති | (ක්‍රි) | - | පිවිසෙයි |
| ගණ්හිතුං | (තු) | - | අල්වාගන්නට |
| පරිජපි | (ක්‍රි) | - | ජප කළේය |
| කුජ්ඣිත්වා | (පූ.ක්‍රි) | - | කිපී |
| අනුබන්ධි | (ක්‍රි) | - | ලුහු බැන්දේය |
| පලායන්තො | (කි) | - | පැනයන්නේ |
| පක්ඛලිත්වා | (පූ.ක්‍රි) | - | පැකිලී |
| පතමානො | (කි) | - | වැටෙන්නේ |
| පරිහාසවචන | (ස) | - | පරිහාස වචන |
| පරිචයෙන | (නා) | - | පුරුද්දෙන් |
| වදන්තො | (කි) | - | කියමින් |
| අනුබන්ධන්තස්ස | (කි) | - | ලුහු බඳින්නා වූ |
| නාගරඤ්ඤො | (ස) | - | නා රජුගේ |
| සොතපථෙ | (ස) | - | කන් සිදුරෙහි |

**අභ්‍යාස**

1. 'මිච්ඡාදිට්ඨිකො අභිගුණ්ඨිකො' ඡේදය සිංහලට නගන්න.
2. ඡේදය ආශ්‍රයෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. අභිගුණ්ඨිකො කථං ජීවිකං කප්පෙසි?
ii. අභිගුණ්ඨිකො කත්ථ නිවාසං ගහෙත්වා නිසීදි?
iii. කෙ රත්තිභාගෙ සයන්තා 'නමො බුද්ධාය''ති වදන්ති?
iv. සො පන අභිගුණ්ඨිකො මිච්ඡාදිට්ඨිකො උදාහු සම්මාදිට්ඨිකො?
v. නාගරාජා කිං සුත්වා කුජ්ඣිත්වා තං මාරෙතුකාමො අනුබන්ධි?

## කිතක නාම

ධාතුවක් අගට ප්‍රත්‍යයක් එකතු වී සෑදෙන පද විශේෂයකට කිතක යැයි කියනු ලැබේ. **(පච + මාන > පචමාන)** තද්ධිත පද හා කිතක පද වෙනස් වන්නේ තද්ධිත නාමයකට පරව ප්‍රත්‍යයක් එකතු වී සෑදීමත් **(කචච + ආන > කචචාන)** කිතක ධාතුවකට පර ව ප්‍රත්‍යයක් එකතු වී සෑදීමත් නිසා ය.

පුල්ලිංග, ස්ත්‍රීලිංග හා නපුංසකලිංග යන ලිංග තුනෙහි ම යෙදෙන මේවා නාම මෙන් විභක්තිවල වරනැගිය හැකි ය.

### කිතක ප්‍රභේද

**කිච්ච** හා **කිතක** වශයෙන් කිතක ප්‍රධාන කොටස් දෙකකට බෙදේ.

**1. කිච්ච**

මේවා කර්ම කාරකයෙහි හා භාව කාරකයෙහි යෙදේ.

උදා:- **සබ්බෙහි කුසලං කත්තබ්බං.**
(සියල්ලන් විසින් පින් කළ යුතු ය)
**තයා මඤ්චෙ සයිතබ්බං.**
(තා විසින් ඇඳෙහි ශයනය කළ යුතු ය)

| | |
|---|---|
| **කත්තබ්බ** | (කළ යුතු) |
| **භවිතබ්බ** | (විය යුතු) |
| **කරණීය** | (කළ යුතු) |
| **භවනීය** | (විය යුතු) |
| **වජ්ජ** | (කිය යුතු) |
| **දම්ම** | (දමනය කළ යුතු) |

**2. කිතක**

කිතක නාම ප්‍රභේද කීපයකින් යුක්ත ය. මේවා කාල තුනෙහි හා කර්තෘ කාරකයෙහි යෙදේ.

i. **අතීත කිතක**
ii. **වර්තමාන කිතක**
iii. **අනාගත කිතක**
iv. **ත්‍රෛකාලික කිතක**
v. **අව්‍යය කිතක**

## I. අතීත කිතක

**ත, තවන්තු, තාවී** යන ප්‍රත්‍යය යෙදීමෙන් අතීත කිතක පද සාදාගනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| **භූත** | (සිදු වූ) | **නීත** | (ගෙන ගිය) |
| **කත** | (කරන ලද) | **ජිත** | (දිනූ) |
| **භීත** | (බියපත්) | **දෙසිත** | (දේශනා කළ) |
| **භුත්තාවී** | (අනුභව කළ) | **හත** | (නසන ලද) |
| **බුද්ධ** | (අවබෝධ කළ) | **ලිඛිත** | (ලියන ලද) |

උදාඃ- **බුද්ධෙන ධම්මො දෙසිතො** (බුදුරදුන් විසින් ධර්මය දේශනා කරන ලදී)
**සො මඤ්චෙ සයිතො** (ඔහු ඇඳෙහි ශයනය කළේය)
**සො ගාමං ගතාවී** (ඔහු ගමට ගියේය)

## II. වර්තමාන කිතක

**මාන, අන්ත** යන ප්‍රත්‍යය යොදා සාදා ගන්නා වර්තමාන කිතක නාම පහත දක්වා ඇති අයුරින් වාක්‍යයන්හි යෙදිය හැකි ය.

උදාඃ- **ගච්ඡන්තො/ගච්ඡමානො අජං හරති** (යන්නා එළුවෙකු ගෙන යයි)
**බාලිකා රොදන්තී පාඨසාලං ගච්ඡති** (බාලිකාව හඬන්නී පාසැලට යයි)

| | | |
|---|---|---|
| **රොදන්ත,** | **රොදමාන** | (හඬන) |
| **කිණන්ත,** | **කිණමාන** | (මිල දී ගන්නා) |
| **පස්සන්ත,** | **පස්සමාන** | (බලන) |
| **සුණන්ත,** | **සුණමාන** | (අසන) |
| **නහායන්ත,** | **නහායමාන** | (නාන) |

## III. අනාගත කිතක

**ස්සං, මාන** ආදි ප්‍රත්‍යය අනාගත කිතක ප්‍රත්‍යය වශයෙන් යෙදේ.

උදාඃ- **සො කම්මං කරිස්සං වජති** (ඔහු කර්ම කරන්නේ යයි)

| | |
|---|---|
| **කරිස්සං** | (කරන්නේ) |
| **කුරුමානො** | (කරන්නේ) |

ඉහත කී වර්තමාන, අතීත හා අනාගතකාලික කිතක පද ලිංගත්‍රයෙහි වරනැගෙන බව ද දත යුතු ය.

## IV. ත්‍රෛකාලික කිතක

ත්‍රෛකාලික කිතක ප්‍රත්‍යය බොහෝ ය. මේවා තුන් කල්හි ම කර්තෘ කාරකයෙහි යෙදේ.

උදා:- **පාපකාරී දණ්ඩෙන යාචකං පහරි.**
(පව් කරන්නා පොල්ලෙන් හිඟන්නාට ගැසුවේය)

| | | | |
|---|---|---|---|
| **පාලක** | (රකින්නා) | **යාචක** | (සිඟන්නා) |
| **සවණ** | (ඇසීම) | **පචන** | (පිසීම) |
| **භොජන** | (අනුභව කිරීම) | **වදතු** | (කියන්නා) |
| **කත්තු** | (කරන්නා) | **පාපකාරී** | (පව් කරන්නා) |
| **ධම්මධර** | (ධර්මය දරන) | **දිනකර** | (දවස කරන, හිරු) |

## V. අව්‍යය කිතක

- **පූර්ව ක්‍රියා කිතක**

අවසාන ක්‍රියාවන්ට මුලින් සිදුවන ක්‍රියා පූර්ව ක්‍රියා නම් වෙයි.

උදා: **සො ගෙහං ගන්ත්වා ආහාරං භුඤ්ජති.**
(ඔහු ගෙදර ගොස් අහර අනුභව කරයි)

| 'ත්වා' ප්‍රත්‍යය | 'ත්වාන' ප්‍රත්‍යය | තුන' ප්‍රත්‍යය | |
|---|---|---|---|
| **පචිත්වා,** | **පචිත්වාන,** | **පචිතුන** | (පිස) |
| **දත්වා,** | **දත්වාන,** | **දාතුන** | (දී) |
| **ගන්ත්වා** | **ගන්ත්වාන,** | **ගන්තුන** | (ගොස්) |
| **සුත්වා,** | **සුත්වාන,** | **සොතුන** | (අසා) |
| **කත්වා,** | **කත්වාන,** | **කාතුන** | (කොට) |

- **තුමන්ත ක්‍රියා කිතක**

අවසාන ක්‍රියාවෙන් පසු ව කරන ක්‍රියා තුමන්ත ක්‍රියා නම් වේ. **"පුරිසො ධම්මං සොතුං ගච්ඡති"** මෙහි **'ගච්ඡති'** යන යෑමේ ක්‍රියාවට පසුව **'සොතුං - අසන්නට'** යන ක්‍රියාව සිදු වේ. **තුං** අන්ත බැවින් මේවාට **'තුමන්ත'** නාමය ලැබී ඇත.

| | | | |
|---|---|---|---|
| **පචිතුං** | (පිසන්නට) | **හරිතුං** | (ගෙනයන්නට) |
| **නෙතුං** | (පමුණුවන්නට) | **දාතුං** | (දෙන්නට) |
| **පාතුං** | (බොන්නට) | **කාතුං** | (කරන්නට) |
| **ඨාතුං** | (සිටින්නට) | **හසිතුං** | (සිනාසෙන්නට) |
| **ගන්තුං** | (යන්නට) | **යාචිතුං** | (ඉල්ලන්නට) |

පහත දැක්වෙන වගුව අධ්‍යයනය කරන්න.

| ධාතුව | අර්ථය | තබ්බ | ත | න්ත | ත්වා | තුං |
|---|---|---|---|---|---|---|
| කර | කිරීම | කත්තබ්බ | කත | කරොන්ත | කත්වා | කාතුං |
| ගමු | යාම | ගන්තබ්බ | ගත | ගච්ඡන්ත | ගන්ත්වා | ගන්තුං |
| ඨා | සිටීම | ඨාතබ්බ | ඨිත | තිට්ඨන්ත | ඨත්වා | ඨාතුං |
| දා | දීම | දාතබ්බ | දින්න | දදන්ත | ත්වා | දාතුං |
| පච | පිසීම | පචිතබ්බ | පක්ක | පචන්ත | පචිත්වා | පචිතුං |
| පා | බීම | පාතබ්බ | පීත | පිවන්ත | පීත්වා | පාතුං |
| භාස | කීම | භාසිතබ්බ | භාසිත | භාසන්ත | භාසිත්වා | භාසිතුං |
| භුජ | බුදීම | භුඤ්ජිතබ්බ | භුත්ත | භුඤ්ජන්ත | භුඤ්ජිත්වා | භුඤ්ජිතුං |
| භූ | වීම | භවිතබ්බ | භූත | භවන්ත | භවිත්වා | භවිතුං |
| සු | ඇසීම | සොතබ්බ | සුත | සුණන්ත | සුත්වා | සොතුං |

**අභ්‍යාස**

1. පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

i. ගාමං ගච්ඡන්තො දාරකො හසති.
ii. භික්ඛු ගාමෙ විහරන්තො ධම්මං දෙසෙති.
iii. කඤ්ඤා හසමානා භාසන්ති.
iv. යාචකා පචන්තං ඉත්ථිං ආහාරං යාචන්ති.
v. පුරිසො ඵලානි ඛාදමානො රුක්ඛෙ නිසීදති.

2. පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

i. ඔහු නගරයට යන්නේ හඬයි.
ii. වෙළෙන්දා බඩු විකුණමින් ගම්වල ඇවිදියි.
iii. ළමයා සිනා සෙමින් ගෙදර ගියේය.
iv. මව බත් පිසන්නී හිඳියි.
v. අපි දුවන මිනිසුන් බලමු.

3. පහත සඳහන් කිතකපද යොදා වාක්‍ය තනන්න.

නිසීදන්තො, ධාවන්තී, සුණන්තො, සයන්තී, ගච්ඡන්තියො

4. පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

i. සො ගාමං ගතො.
ii. බාලකෙහි කථා සුතා.
iii. ආගතාය නරාය ජලං දෙහි.
iv. මයා බුද්ධස්ස චරිතං සුතං.
v. නරෙහි ඵලානි ඛාදිතානි.

5. පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

i. ඔහුගේ ගෙදර පුතෙක් උපන්නේය.
ii. රාම ගමට ගියේය.
iii. මිනිසුන් විසින් ඔහුගේ කථාව අසන ලදි.
iv. දරුව, ලියන ලද පාඩම කියවන්න.
v. මා විසින් මෙසේ අසන ලදි.

6. 'මිච්ඡාදිට්ඨිකො අභිගුණ්ඨිකො' ඡේදයේ දැක්වෙන කිතක පද උපුටා දක්වන්න.

7. පහත සඳහන් කිතක පද වර්ග කර දක්වන්න.

| | | | | |
|---|---|---|---|---|
| කත්තබ්බං | දායක | භූත | පචිත්වා | පචිතුං |
| දාතුං | දත්වා | නීත | පාලක | භවනීය |
| ඨත්වා | වජ්ජ | කාතුං | දාතු | හීත |

8. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. කිතක පද සාදා ගන්නේ කෙසේ ද?
ii. කිතක ප්‍රභේද ලියා දක්වන්න.
iii. අතීත කිතක හඳුන්වා දෙන්න.
iv. අව්‍යය කිතක පැහැදිලි කරන්න.
v. ත්‍රෛකාලික කිතක හඳුන්වන්න.